# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 397/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 07/03/2024

පැය 1140

## මාධ්‍ය නිවේදනය

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු**

**01. 2024.03.06 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරින් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 03 | 03 | 60.150 | 561 | යකඩ බැරල් 04<br>තඹ දඟර 02 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථාන වෙත ඉදිරිපත් කර ඇත.

**02. බලපත්‍ර නොමැතිව පතල් කැණීම් සිදු කල සැකකරුවන් නව දෙදෙනකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පස්සර කඳවුර**

2024.03.06 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා පස්සර කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත පස්සර පොලිස් වසමේ උඩගම රක්ෂිත ප්‍රදේශයේ වැටලීමක් සිදු කර අනවසරයෙන් රක්ෂිත ප්‍රදේශයේ පතල් කැණීම් සිදු කරන ලද සැකකරුවන් නව දෙදෙනකු අත්අඩංගුවට ගෙන පස්සර පොලිස් ස්ථනය වෙත භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 27 - 48 අතර වයස් වල පසුවන පස්සර, මොණරාගල, දමනයවෙල සහ ගාල්ල ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.** පස්සර පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03. පුරාවස්තු සෙවීමේ අරමුණින් කැණීම් සිදු කල සැකකරුවන් හය දෙදෙනකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා තලවකැලේ කඳවුර**

2024.03.06 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා තලවකැලේ කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත නාවලපිටිය පොලිස් වසමේ රොජසන්ගම ප්‍රදේශයේ අක්කර 39 රක්ෂිතයේදී වැටලීමක් සිදු කර පුරාවස්තු

සෙවීමේ අරමුණින් කැණීම් සිදු කරන ලද සැකකරුවන් හය දෙදෙනකු අත්අඩංගුවට ගෙන නාවලපිටිය පොලිස් ස්ථනය වෙත භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 22ත් සහ 52ත් අතර වයස් වල පසුවන නාවලපිටිය ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.** නාවලපිටිය පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**04. නීති විරෝධි ලෙස විදේශීය දුම්වැටි සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර.**

2024.03.02 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත මීගමුව පොලිස් වසමේ විස්ක්‍රීන් මාවත ප්‍රදේශයේ වැටලීමක් සිදු කර නීති විරෝධි ලෙස විදේශීය දුම්වැටි 600 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මීගමුව පොලිස් ස්ථානයට භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 42 ක් වූ මීගමුව ප්‍රදේශයේ** පදිංචිකරුවකු වේ. මීගමුව පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**05. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා උඩවලව කඳවුර.**

2024.03.06 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා උඩවලව කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත තණමල්විල පොලිස් වසමේ කිවිල සූරියආර ප්‍රදේශයේ වැටලීමක් සිදුකර මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්ඩංගුවට ගෙන තණමල්විල පොලිස් ස්ථානයට භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 43 ක් වූ තණමල්විල ප්‍රදේශයේ** පදිංචිකරුවකු වේ. තණමල්විල පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**06. ගංජා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කතරගම කඳවුර.**

2024.03.06 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කතරගම කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත කතරගම පොලිස් වසමේ බුත්තල කතරගම මාර්ගයේදී වැටලීමක් සිදු කර ගංජා කිලෝ 01 ග්‍රෑම් 730ක් සමඟ සැකකරුවකු අත්ඩංගුවට ගෙන වැඩිදුර විමර්ශන සඳහා කතරගම පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 33ක් වන රදාවෙල ප්‍රදේශයේ** පදිංචිකරුවන් වේ.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**